SLGURU.LK

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Educatio cation Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ග ne ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ

ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025
இரண்டாம் தவணைப் பரீட்சை - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 12 | විෂයය Subject: සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය 1 | කාලය Time: පැය 2 |
| නම | | |

## සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

1. සන්නිවේදන අධ්‍යයනය ප්‍රධාන විෂයක් ලෙස හැඳින්වීමට පෙර එය ප්‍රධාන විෂයන් තුනක අන්තර්ගත විය. එම විෂයන් තුන නම්,
i.මනෝවිද්‍යාව, සමාජවිද්‍යාව, දේශපාලන විද්‍යාව
ii.මනෝවිද්‍යාව, සමාජවිද්‍යාව, ආර්ථික විද්‍යාව
iii.ආර්ථික විද්‍යාව, පුරා විද්‍යාව, දේශපාලන විද්‍යාව
iv.ආර්ථික විද්‍යාව, රසායනික විද්‍යාව, දේශපාලන විද්‍යාව
v.මනෝ විද්‍යාව, රසායනික විද්‍යාව, දේශපාලන විද්‍යාව

2. ක්‍රි.ව 1864 උපත ලද චාර්ල්ස් හෝර්ටන් කූලි විද්වතා
i.සමාජ විද්‍යාඥයෙකි ii.ආර්ථික විද්‍යාඥයෙකි iii.දේශපාලන විද්‍යාඥයෙකි
iv.රසායනික විද්‍යාඥයෙකි v අධ්‍යාපන විද්‍යාඥයෙකි

3. සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයක් ලෙස ඉගැන්වීම ආරම්භ කළ ප්‍රථම විශ්වවිද්‍යාලය වනුයේ,
i ඉලිනොයිස් විශ්වවිද්‍යාලය ii වික්ටෝරියා විශ්වවිද්‍යාලය
iii මෙල්බර්න් විශ්වවිද්‍යාලය iv පිලිපීන විශ්වවිද්‍යාලය v දිල්ලි විශ්වවිද්‍යාලය

4. සන්නිවේදනය මාධ්‍ය අධ්‍යයනය විෂය පාසල් විෂය මාලාවේ 10 ශ්‍රේණියට හඳුන්වා දෙනු ලැබුයේ,
i 2006 ii 2007 iii 2008 iv 2009 v. 2010

5. කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ සන්නිවේදන විෂය ඉගැන්වූ ප්‍රථම කථිකාචාර්යවරු දෙපළ
1. මහාචාර්ය විමල් දිසානායක සහ මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර
ii. මහාචාර්ය එඩ්වින් ආරියදාස සහ මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර
iii. ආචාර්ය පියසෝම මේදිස් සහ මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර
iv. මහගම සේකර සහ ඩබ්. අමරදේව
v. ආචාර්ය පියසෝම මේදිස් සහ මහාචාර්ය එඩ්වින් ආරියදාස

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

6. පෙළඹවීමේ කාර්යය වඩාත් සාර්ථක වන්නේ අදාළ තොරතුරු
i. තර්කානුකූලව හා සංවිධානාත්මකව ඉදිරිපත් කරන විට ය.
ii.පුද්ගල භාව චරිත ලක්ෂණ ඉලක්ක කරන විට ය.
iii. නිශ්චිතව පැහැදිලිව හා සරලව ගෙනහැර දක්වන විට ය.
iv. අතීත අත්දැකීම් සසඳමින් ප්‍රකාශ කරන විට ය.
v. උපයෝගී කරගෙන ප්‍රතිලාභ හා අවධානම් පිළිබඳ සාධක පෙන්වා දෙන විට ය.

7. විද්‍යා ගුරුවරයකු කළුලෑල්ලේ ලියූ අංක කිහිපයක් අපැහැදිලි වීම නිසා සඳා සිය පොතෙහි ලියා ගත් අංක සාවද්‍ය විය. එබැවින් පිළිතුරු ද අසාර්ථක විය. මෙය සන්නිවේදනයේ විග්‍රහයට අනුව,
i.. ග්‍රාහක දෝෂයකි ii.බාධක තත්ත්වයකි iii. සාවද්‍ය චින්තනයකි
iv. පරිකල්පන ගැටලුවකි v.අනවබෝධයකි

8. විද්‍යාලයීය ක්‍රීඩා උත්සවයේදී කවපෙත්ත දැමීමේදී ලක්වූ අනතුරකින් තුවාල ලැබූ ශිෂ්‍යයෙකුට ප්‍රථමාධාර ලබා දුන් ප්‍රධාන ශිෂ්‍යනායකයා සඳහන් කළේ තමා කියවා තිබූ පොත් හා ප්‍රථමාධාර දෙන ආකාරය නිරීක්ෂණය කර තිබීම ඒ සඳහා උපකාරී වූ බවයි. මෙම කරුණ අයත් වන සන්නිවේදන මූලිකාංගය වන්නේ,
i.. ආකේතකරණයයි 2. විකේතකරණයයි 3. ප්‍රතිපෝෂණයයි
4. අත්දැකීම් පසුතලයයි 5. සන්දේශ ග්‍රහණයයි.

9. සන්නිවේදන ක්‍රියාවලියෙහි අන්තර්ගතය ලෙස සැලකෙන්නේ,
i.සන්දර්භයයි ii.බලපෑමයි iii.ග්‍රාහක ක්ෂේත්‍රයයි iv.පණිවුඩයයි v.නාලිකාවයි

10. සන්නවේදනයෙහි කාර්යයන් පිළිබඳ නොගැලපෙන යෙදුමක් සහිත කාණ්ඩය නම් කරන්න.
i තොරතුරු සම්පාදනය, විනෝදාස්වාදය, උපදෙස් සම්පාදනය
ii තොරතුරු සම්පාදනය, විනෝදාස්වාදය, අධ්‍යාපනය සැපයීම
iii තොරතුරු සම්පාදනය, විනෝදාස්වාදය, මාධ්‍යසාක්ෂරතාව
iv විනෝදාස්වාදය, උපදෙස් සම්පාදනය, පෙළඹවීම
v උපදෙස් සම්පාදනය, පෙළඹවීම, සමාජානුයෝජනය

11. නිපුනිගේ නිවසේ ඇති සැටලයිට් තාක්ෂණයෙන් යුත් රූපවාහිනී යන්ත්‍රය ක්‍රියාත්මක කරවීමේදී රූප රාමු අපැහැදිලි වීම සහ අදාළ නාලිකා විසන්ධි වීම නිතර දක්නට ලැබේ. එයින් න්‍යායාත්මකව හඳුනාගත හැක්කේ කුමක්ද?
i. රූපවාහිනි යන්ත්‍රය අලුත් වැඩියා කළ යුතුව ඇති බවයි.
ii. රූපවාහිනී යන්ත්‍රය නිවැරදිව සුසර කළ යුතු බවයි.
iii. මාධ්‍ය බාධක සහිත බවයි.
iv. අර්ථ බාධක සහිත බවයි.
v. ඇන්ටනාව වෙනස් කළ යුතු බවයි.

12. නිර්වාචික සන්නිවේදනය කලාත්මකව සහ ප්‍රබලව යොදා ගත හැකි මාධ්‍ය වන්නේ, 1. සිනමාවයි. 2 රූපවාහිනියයි. 3 ගුවන්විදුලියයි.
4 අන්තර්ජාලයයි. 5 නව මාධ්‍යයයි.

13. මූලාශ්‍රය පැහැදිලිව හඳුනාගත නොහැකි සන්නිවේදන ස්වරූපය වන්නේ,
1. වාචික සන්නිවේදනයයි. 2. විධිමත් සන්නිවේදනයයි.
3. අවිධිමත් සන්නිවේදනයයි 4. නිර්වාචික සන්නිවේදනයයි.
5. කථන සන්නිවේදනයයි

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

14. වෙරළබඩ ගම්මානයක ජනතාවට සුනාමි අනතුරක දී ඉතා ඉක්මනින් හා පුළුල් ලෙස අනතුරු ඇඟවීමක් කළ හැකි වන්නේ,
1 ලිඛිත සන්නිවේදනයෙනි.
2. දෘශ්‍ය සන්නිවේදනයෙනි.
3. ශ්‍රව්‍ය සන්නිවේදනයෙනි.
4 ශ්‍රව්‍ය-දෘශ්‍ය සන්නිවේදනයෙනි.
5 ලිඛිත හා දෘශ්‍ය සන්නිවේදනයෙනි.

15. ජන සන්නිවේදනය, සෙසු සන්නිවේදන වර්ග අතුරෙන් වෙනස් වීමට හේතු වන්නේ එකී ක්‍රියාවලියේ දෘශ්‍යමාන
1. කර්මාන්තමය ස්වභාවයයි.
2. සමජාතීය ග්‍රාහක ක්ෂේත්‍රයයි.
3. සන්නිවේදක-ග්‍රාහක සමීපතාවයි.
4. සක්‍රීය ප්‍රතිපෝෂණයයි.
5. අසන්තතික බවයි.

16. ජනමාධ්‍ය ආයතන ඇතැම් කරුණු සම්බන්ධයෙන් වැඩි අවධාරිත බලයක් යොදයි. මෙය HUB ආකෘතියෙන් පෙන්නුම් කරනුයේ,
1. පෙරහනු මගිනි.
2 බලපෑම මගිනි.
3 මාධ්‍ය විස්තාරණය මගිනි.
4. ප්‍රතිපෝෂණය මගිනි.
5. දොරටුපාලක මගිනි.

17. ජනමාධ්‍ය සන්දේශ අවබෝධ කර ගැනිමට, පිළිගැනීමට, ප්‍රතික්ෂේප කිරීමට හෝ මතක තබා ගැනීමට ග්‍රාහක ක්ෂේත්‍රයේ සමාජිකයන් විසින් යොදාගනු ලබන ඔවුන් සතු අත්දැකිම් පසුතලය HUB ආකෘතියෙන් පෙන්නුම් කරනුයේ,
1. පෙරහනු මගිනි.
2 බලපෑම මගිනි.
3 මාධ්‍ය විස්තාරණය මගිනි.
4. ප්‍රතිපෝෂණය මගිනි.
5. දොරටුපාලක මගිනි.

18. එකම පන්තියක අධ්‍යාපනය ලැබූ මිතුරන් සමූහයක් විභාගය සමත් වීමෙන් පසු ශිෂ්‍යත්ව ලබා විදෙස්ගත වූහ. ඔවුහු නූතන සන්නිවේදන විධික්‍රම උපයෝගි කර ගනිමින් තොරතුරු හුවමාරු කර ගත්හ. එම තොරතුරු හුවමාරුව සිදුවූයේ,

A - යන්ත්‍ර සහායක හා කණ්ඩායම් සන්නිවේදනයෙනි.
B - අතථ්‍ය හා තාක්ෂණික සන්නිවේදනයෙනි.
C - යන්ත්‍ර සහායක හා අතථ්‍ය සන්නිවේදනයෙනි.
D - යන්ත්‍ර සහායක හා තාක්ෂණික සන්නිවේදනයෙනි.

මේ ඇසුරින් සත්‍ය වන්නේ,
1 A හා B ය.
2 A හා C ය.
3 B හා C ය.
4 C හා D ය.
5 A, B, C හා D ය.

19. අරමුණු, වගවීම හා සුසංයෝගය වැනි කරුණු පිළිබඳ සංසන්දනාත්මකව සලකා බලන විට වඩාත්ම වගකීම් සහිත සන්නිවේදන ප්‍රභේදය කුමක්ද?
1. සමූහ සන්නිවේදනය
2. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය
3. අන්තර්පුද්ගල සන්නිවේදනය
4. ජන සන්නිවේදනය
5. මහජන සන්නිවේදනය

20. ජනසන්නිවේදන ක්‍රියාවලිය තුළ දක්නට නොලැබෙන්නේ,
1. විධිමත් ආයතනික රටාවක පැවැත්මයි
2. තාක්ෂණික යන්ත්‍රසූත්‍ර භාවිතයේ බහුලතාවයි.
3. දොරටුපාලකයන් ගණනාවකගේ මැදිහත් වීමයි
4. සන්නිවේදක- ග්‍රාහක සම්බන්ධතාවෙහි සමීප බවයි
5. වාණිජත්වය පදනම් වූ ලාභාපේක්ෂාවයි

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

21.ජනමාධ්‍ය භාවිතයේදී සෙසු ඒවාට සාපේක්ෂව උදාසීන මාධ්‍ය යුගලය වන්නේ,
1. පුවත්පත් හා සඟරා ය. 2. ගුවන්විදුලිය හා රූපවාහිනි ය.
3. සිනමාව හා නව මාධ්‍යය ය. 4. පුවත්පත් හා ගුවන්විදුලි ය.
5. සිනමාව හා රූපවාහිනී මාධ්‍යය ය.

22. උදැසන අවදිවන සදීකාට හිසරදයක් දැනුණි. ඒ අනුව ඇය පාසල් නොයෑමට තීරණය කළාය. මෙබඳු අවස්ථාවක දක්නට ලැබෙන්නේ,
1. අවිධිමත් සන්නිවේදනය යි. 2. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය යි.
3. අන්තර් පුද්ගල සන්නිවේදනය යි. 4. නිර්වාචික සන්නිවේදනය යි.
5. විධිමත් සන්නිවේදනය යි.

23. පරිගණකය මැදිහත් අන්තර්ජාලය ප්‍රධාන සංරචකය කර ගත් සන්නිවේදන වර්ගය වනුයේ,
1. සමූහ සන්නිවේදනය යි. 2. අතථ්‍ය සන්නිවේදනය යි.
3. අන්තර් පුද්ගල සන්නිවේදනය යි. 4. නිර්වාචික සන්නිවේදනය යි.
5. විධිමත් සන්නිවේදනය යි.

24. රුවන් පුවත්පතක කොටස් වශයෙන් පළකිරීමේ අපේක්ෂාවෙන් තම අතීත අත්දකීම් ගළපමින් නවතකාවක් නිර්මාණය කිරීම තුළ ක්‍රියාත්මක වූ සන්නිවේදන වර්ගය ,
1. සමූහ සන්නිවේදනය යි. 2. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය යි.
3. අන්තර් පුද්ගල සන්නිවේදනය යි. 4. නිර්වාචික සන්නිවේදනය යි.
5. විධිමත් සන්නිවේදනය යි.

25. සඳපබා තමා පමණක් ඇසින් දුටු සිදුවීමක් තම හිතවත් සදීකාට පවසුවාය. එහෙත් දින කිහිපයකින් එම සිදුවීම පාසල පුරා පැතිර තිබිණි. මෙම තත්ත්වය හා වඩාත් ගැලපෙන සන්නිවේදන ස්වරූපය වනුයේ,
1. වාචික හා විධිමත් සන්නිවේදනයයි. 2. ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනයයි.
3. දෘශ්‍ය හා වාචික සන්නිවේදනයයි. 4. දෘශ්‍ය හා විධිමත් සන්නිවේදනයයි.
5. වාචික හා අවිධිමත් සන්නිවේදනයයි.

26. සාම්ප්‍රදායික මාධ්‍යවල වැදගත්කම පිළිබඳ පන්ති කාමරයේදී ඇතිවූ සංවාදයක ප්‍රකාශ කිහිපයක් පහත් දක්වේ.

නයනි - ඒවා ගැන පොදු ජනතාව තුළ විශ්වාසයක් නෑ.
ජයනි - එහිදී භාවිතා වන සඥා සංකේත හුරු පුරුදුයි.
විපුලි - ඒවායින් ඉදිරිපත් වන්නේ ප්‍රභූන්ගේ අදහස් නොවේ.
රුවනි - ඒ වුනාට සක්‍රීය ග්‍රාහක සහභාගීත්වයක් නැහැ.

ඉහත ප්‍රකාශවලින් නිවැරදි අදහස ඉදිරිපත් කරන්නේ,
1. නයනි හා රුවනි ය. 2. නයනි හා ජයනි ය 3. නයනි,ජයනි හා රුවනි ය
4. නයනි, ජයනි, හා විපුලිය 5.නයනි, ජයනි, විපුලි හා රුවනි යන සියලු දෙනාම

27. සාම්ප්‍රදායික මාධ්‍ය විධික්‍රම ලෙස සැලකෙන ශාන්තිකර්ම හා යාතුකර්ම ඇතුළත් ප්‍රධාන විෂය ධාරාව වනුයේ,
1. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනයයි 2. සමාජ විද්‍යාවයි
3. ජන ශ්‍රැති විද්‍යාවයි 4. මනෝ විද්‍යාවයි
5. ප්‍රාසාංගික කලා

28. උඩරට ප්‍රදේශවල පත්තිනි දේවතාව මුල්කර කර ගෙන පවත්වනු ලබන ජන නාටකයක් ලෙස හැඳින්විය හැක්කේ,
1. සොකරි 2. කෝලම් 3. රූකඩ 4.වඩිමෝඩි 5. නාට්ටුක්කුත්තු

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

29. යම් සිද්ධියක් මුල, මැද, අග යන අංගත්‍රය මනාව ගලපන ලද ජනයාගේ ජීවන අරගලය, අපේක්ෂා, ආශා, දුක්දෝමනස්ස හා ගවේශන යනාදිය පිලිබුඹු කරන කතාන්දර හැඳින්වෙනුයේ,
1. ගැමි කතා 2. මිත්‍යාකතා 3. ජනකතා 4.උපහාස කතා 5. වීර කතා

30. යුද තොරතුරු ලබාගැනීමට භාවිතා කළ මාධ්‍ය පසුකාලීනව ජනයා වෙනුවෙන් භාවිතා කළ යුතු බව ප්‍රථම වරට ප්‍රකාශ කරන ලද්දේ,
1. විල්බර් ශ්‍රාම් 2. ජෝන් රීත් 3. ඇරිස්ටෝටල්
4. චාල්ස් කූලි 5. ටිම් බාන්ස් ලී

31. "ආරක්ෂකයකුග් භූමිකාව ඉටුකිරීම" ජනමාධ්‍ය මගින් ඉටුකරන ප්‍රධාන භූමිකාවක් ලෙස දක්වන ලද්දේ,
1. කාර්ට් ලෙවින් 2. ජෝන් ඩුවී 3. හැරල්ඩ් ඩී ලැස්වෙල්
4. තෝමස් එඩිසන් 5. විල්බර් ශ්‍රාම්

32 අදෘශ්‍යමානව වෙසෙන පිරිසකට කිසියම් මාධ්‍යකින් අමතන්නේ නම්, එය හැඳින්වෙනුයේ,
1. නව මාධ්‍ය ලෙසට ය. 2. සමාජ මාධ්‍ය ලෙසට ය. 3. ජන මාධ්‍ය ලෙසට ය.
4. සුපරීක්ෂණය ලෙසට ය. 5. සාම්ප්‍රදායික මාධ්‍ය ලෙසට ය.

33. ගුවන්විදුලි ප්‍රචාරය විධිමත් ලෙස අරම්භ වනුයේ,
1. 1914 - 1915 කාලයේදී ය. 2. 1924 - 1925 කාලයේදී ය.
3. 1911 - 1912 කාලයේදී ය. 4. 1933 - 1934 කාලයේදී ය.
5. 1907 - 1908 කාලයේදී ය.

34. පරිකල්පන ශක්තිය ප්‍රබලව ඉහළ නංවන මාධ්‍යක් ලෙස සැලකෙන්නේ,
1. රූපවාහිනී මාධ්‍යයි 2. ගුවන්විදුලි මාධ්‍යයි.
3. සිනමාවයි 4. පුවත්පතය 5. මාලික ප්‍රකාශනයයි.

35. බස් රථයක ගමන් කරමින් සිටි රවීට අසල අසුනේ සිටි තැනැත්තා අසන ප්‍රශ්නවලට පිළිතුරු දීම මහත් කරදරයක් විය. තම ජංගම දුරකථනයට කන්බණුව (Earphone) සම්බන්ධ කළ රවී ගුවන්විදුලි ගීතයකට සවන් දීමට පටන් ගත්තේ ය. මෙය ජන සන්නිවේදනයේ කවර ප්‍රයෝජනයක් ලෙස සැලකෙන්නේ ද?
1. ප්‍රජානනය (Cognition) 2.සමාජානුයෝජනය (Socialization)
3. සමාජ උපයෝගිතාව (Social Utility) 4 නිෂ්කර්ෂණය (Withdrawal)
5. අපසරණය (Diversion)

36. මාර්ගගත දත්ත පද්ධතියක් මගින් විවිධ තොරතුරු මූලයන්ට ප්‍රවේශ වීමට ඇති හැකියාව හඳුන්වන යෙදුම කුමක් ද?
1.අංකිතකරණය (Digitalisation) 2. ජාලගතකරණය (Networking)
3.අන්තර් ක්‍රියාකාරීත්වය(Interactivity) 4.අධිපාඨනීයත්වය (Hypertexuality)
5. ස්වයංකරණය (Automation)

37. පහසුවෙන් ලබා ගැනිමට හැකි වන ආකාරයෙන් දත්ත පරිගණක ගත කිරීම හඳුන්වන යෙදුම කුමක් ද?
1.අංකිතකරණය (Digitalisation) 2. ජාලගතකරණය (Networking)
3. අන්තර් ක්‍රියාකාරීත්වය(Interactivity) 4.අධිපාඨනීයත්වය (Hypertexuality)
5. ස්වයංකරණය (Automation)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

38. ලෝක ව්‍යාප්ත ජාලයෙහි නිර්මාතෘ ලෙස සැලකෙනුයේ,
1. විල්බර් ශ්‍රාම් 2. ටිම් බර්නස් ලී 3. හැරල්ඩ් ඩී ලැස්වෙල්
4. තෝමස් එඩිසන් 5. කාර්ට් ලෙවින්

39. විහඟි ඡායාරූප ශිල්පිනියක් ලෙස ජනමාධ්‍ය ආයතනයක සේවය කරනු ලබන්නනීය. ඇයගේ පාසල් කාලයේ මිතුරියන් බොහෝ දෙනෙකු සිටින්නනේ විදේශගතව ය. ඈ නිතර සිය යෙහෙළියන් සමග ඡායාරූප හා වීඩියෝ හුවමාරු කර ගන්නීය. මේ සඳහා ඇයට වඩාත් ප්‍රයොජනවත් සමාජ මාධ්‍ය ජාලය වනුයේ,
1. මුහුණු පොත Face book 2. ටුවිටර් Twiter 3. ඉන්ස්ටග්‍රෑම් Instagram
4. වට්ස්ඇප් Whats App 5 විද්‍යුත් තැපැල

40. ආලෝක ප්‍රභවයකට ඉදිරියෙන් හෝ පසුපසින් සෙවනැලි අතිවීමේ සංසිද්ධිය හැඳින්වෙනුයේ,
1.ගුවන්විදුලියේ ආරම්භය ලෙස ය. 2. රූපවාහිනියේ ආරම්භය ලෙසය.
3.චලන චිත්‍රයේ ආරම්භය ලෙස ය. 4. සෙවනැලි නාට්‍ය බිහිවීම ලෙසය
5.විදි නාට්‍ය බිහිවීමේ ආරම්භය ලෙස ය.

41 සාම්ප්‍රදායික මාධ්‍ය විධික්‍රම ලෙස සැලකෙන ශාන්තිකර්ම හා යාතුකර්ම ඇතුළත් ප්‍රධාන විෂය ධාරාව වනුයේ,
1. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනයයි 2. සමාජ විද්‍යාවයි
3. ජන ශ්‍රැති විද්‍යාවයි 4. මනෝ විද්‍යාවයි 5. ප්‍රාසාංගික කලා

42. ගුවන්විදුලි ප්‍රචාරය විධිමත් ලෙස අරම්භ වනුයේ,
1. 1914 - 1915 කාලයේදී ය. 2. 1924 - 1925 කාලයේදී ය.
3. 1911 - 1912 කාලයේදී ය. 4. 1933 - 1934 කාලයේදී ය.
5. 1907 - 1908 කාලයේදී ය.

43. ගෘහස්ථ උපකරණයක් ලෙස ගුවන්විදුලිය ජනතාව අතර වඩාත් ප්‍රචලිත විය. එහි ප්‍රධාන භූමිකා ලෙස දක්විය හැක්කේ,
1 සංස්කෘතික වෙනසක් ඇතිකිරීම, විනෝදාස්වාදය, තොරතුරු සම්පාදනයයි.
2 පෙළඹවීම, විනෝදාස්වාදය, තොරතුරු සම්පාදනය යි
3, සමාජානුයෝජනය විනෝදාස්වාදය, තොරතුරු සම්පාදනය යි
4 සංස්කෘතික වෙනසක් ඇතිකිරීම, සමාජානුයෝජනය, තොරතුරු සම්පාදනය
5 සංස්කෘතික වෙනසක් ඇතිකිරීම, විනෝදාස්වාදය, පෙළඹවීම යි

44. නව මාධ්‍ය අපගේ ගෘහ ජීවිතය ආක්‍රමණය කර ඇති බව එක්තරා දේශකයෙක් අවධාරණය කර සිටියේය. එමගින් ඔහු අදහස් කරන්නේ,
1. නව මාධ්‍ය භවිතය ප්‍රචණ්ඩත්වය වර්ධනය කිරීමට හේතුවන බවයි.
2. නව මාධ්‍ය භාවිතයේ පිරිවැය අවම වී ඇති බවයි.
3. නව මාධ්‍ය සාක්ෂරතාව ඉහළ බැවින් මෙවැන්නක් සිදු වන බවයි.
4. නව මාධ්‍ය තාක්ෂණයේ ප්‍රබලත්වය සීඝ්‍රයෙන් ඉහළ යන බවයි.
5 නව මාධ්‍ය භාවිතය ඉහළ යෑම මගින් පුද්ගලයා හුදකලා වී ඇති බවයි.

45. සන්නිවේදනය,
1. සංකේතාත්මක වූවකි. 2 තාක්ෂණික වූවකි 3 අවස්ථාමය වූවකි
4 ද්විමාර්ගික වූවකි 5 බහුමාර්ගික වූවකි

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

46. මානව සමාජය තුළ සන්නිවේදනය මගින් සිදු කරනු ලබන ප්‍රබල සමාජ මෙහෙවර වනුයේ,

1. අදහස් පොදු බවට පත් කිරීමයි
2 විනෝදය ලබා දීමයි
3 ශික්ෂණය ඇති කිරීමයි
4 ග්‍රාහක බලපෑම ඇති කිරීමයි
5 අන්තර් සබඳතා ගොඩනැගීමයි

47. ගුරුවරයා පන්තියට පැමිණ පාඩම් පොත පෙරළන විටම පාරේ ගිය වාහනයකින් නිකුත් වූ සයිරන් නලා හඬ නිසා ළමය එකිනෙකාගේ මුහුණු ලබා ගත්හ. මෙහි දක්නට ලැබෙන්නේ,

1. අවිධිමත් සන්නිවේදනයකි
2 සන්නිවේදන බාධකයකි
3 අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයකි
4 නිර්වාචික සන්නිවේදනයකි

48.. වසන්ති පුවත්පතක පළ කර තිබූ මනාලියන් හැඩගැන්වීමේ වැඩමුළුවකට සහභාගී වූවාය. ඇය සම්බන්ධවූ සන්නිවේදන වර්ගය වනුයේ,

1.සමූහ සන්නිවේදනය
2. මහජන සන්නිවේදනය
3. අතථ්‍ය සන්නිවේදනය
4. ජන සන්නිවේදනය
5. අන්තර් පුද්ගල සන්නිවේදනය

49. ජාත්‍යන්තර සමුළුවකදී එහි පැමිණි ආරාධිත විදේශීප අමුත්තන් තමාට වෙන්කර තිබූ ආසනය සොයා අසුන් ගත්තේ ය. ඒ සඳහා ඔහුට උපකාරීවූ සන්නිවේදන ස්වරූපය වූයේ,

1. වාචික සන්නිවේදනය
2. ආවාචික සන්නිවේදනය
3. අනතර්වර්තී පුද්ගල සන්නිවේදනය
4. අතථ්‍ය සන්නිවේදනය
5. දෘශ්‍ය සන්නිවේදනයයි

50. දැනුම් සමාජය වර්ධනය කිරීමෙහිලා ඓතිහාසික කාර්යභාරයක් ඉටුකරනු ලැබුයේ,

i පුවත්පතයි
ii පොතයි
iii සඟරාවයි
iv අත්පත්‍රිකාවයි
v දැන්වීමයි

SLGURU.LK
For Educational Purpose Only

“The mind is not a vessel to be filled, but a fire to be kindled.” — Plutarch

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Educatio cation Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ග ne ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2025**

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය Grade | 12 | විෂයය Subject | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය 11 | කාලය Time | පැය 3 |
| නම | | | | | |

**ප්‍රශ්න 05ට පමණක් පිළිතුරු සපයන්න**

1 සන්නිවේදනය ශාස්ත්‍රීය අධ්‍යයනයක් ලෙස වර්ධනය කිරීමට දායක වූ අපරදිග විද්වතුන් 4ක් නම්කරන්න.

ii. මෙරට රූපවාහිනී නාලිකාවක් මගින් විකාශනය වන ප්‍රචණ්ඩ ක්‍රියා සහිත වැඩසටහන් නැරඹීම නිසා පාසල් ළමුන් තුළ ප්‍රධාන වශයෙන් සිදුවිය හැකි වෙනස්කම් දෙකක් නම් කර ඉන් එකක් විස්තර කරන්න.

iii විවහා උත්සව අවස්ථාවකදී භාවිතයට ගත හැකි නිර්වාචික සන්නිවේදන ක්‍රම තුනක් නම් කර විස්තර කරන්න.

iv දරුවන්ට සිය ඉගෙනීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා මාධ්‍ය අධ්‍යාපනය ලබා දීම වැදගත්වන ආකාරය කරුණු හතරක් ඇසුරෙන් විස්තර කරන්න.

2. i.ඔබ ඇසින් දුටු රිය අනතුරක් ඔබේ හිතවතෙකුට ඉතා දුකමුසු මුහුණින් යුතුව ඔබ විස්තර කරයි. මෙය අයත් සන්නිවේදන වර්ගය නම් කරන්න.

ii. සමූහ සන්නිවේදනය යන්නෙන් අදහස් වනුයේ, කුමක්දැයි හඳුන්වන්න.

iii.අන්තර් පුද්ගල සන්නිවේදනය සිදු විය හැකි ක්‍රම දෙක නම් කර කෙටියෙන් විස්තර කරන්න.

iv. HUB ආකෘතියේ ප්‍රධාන අංග හයක් නම් කර හතරක් කෙටියෙන් විස්තර කරන්න.

3. “සන්නිවේදනයේ ස්වභාවය හඳුනා ගැනීමට නම් ඊට ආවේණික පොදු ගති ලක්ෂණ හඳුනාගත යුතුම ය.”

i සන්නිවේදනය සතු එයට ආවේණික ගුණාංග හතරක් නම්කරන්න.

ii ජනසන්නිවේදන ක්‍රියාවලියේදී සන්දේශයට සිදුවන හානිය ප්‍රධාන බාධක ප්‍රබේද 2කට අදාළව නිදසුන් අසුරෙන් විස්තර කරන්න.

iii. සන්නිවේදනය විවිධාකාරය. කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

iv සන්නිවේදන කාර්යන් හතරක් නම්කර සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා එම කාර්යන් උපකාරී වන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න

4.i. සාම්ප්‍රදායික සන්නිවේදනය පරිසර හිතකාමී සන්නිවේදන භාවිතයකි. එහි සුවිශේෂතා හතරක් නම් කර කෙටියෙන් විස්තර කරන්න.

ii. සන්නිවේදන කාර්යය සාර්ථකව ඉටුකර ගැනීමට සාම්ප්‍රදායික මාධ්‍ය විධික්‍රම භාවිතා කළ හැකිය. එකී මාධ්‍ය විධික්‍රම 4ක් නම්කර දෙකක් නිදසුන් සහිතව

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

පැහැදිලි කරන්න.

iii. සාම්ප්‍රදායික මාධ්‍යයේ වැදගත්කම කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න.

iv. සමාජ මාධ්‍ය භාවිතය තුළින් සමාජයට සිදුවන යහපත් හෝ අයහපත් බලපෑම කරුණු හතරක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

5. සුභානි දුරකතනයෙන් නිම්මි අමතා ඊයේ දිනයේ මාර්ගගත පන්තියට නොපැමිණියේ ඇයි දැයි විමසා සිටියා ය.

i. ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතියට අනුව, සුභානි සහ නිම්මි අයත්වන සන්නිවේදන අංග දෙක නම් කරන්න.

ii. ශ්‍රම් ඔස්ගුඩ් ආකෘතියෙහි දැකිය හැකි විශේෂතා හතරක් නම් කර ඉන් එකක් විස්තර කරන්න.

iii. නිම්මි ආවරණ කලාපයෙන් බැහැරව සිටීම නිසා සුභානි දුන් ඇමතුම විසන්ධි විය. මෙම අදහස හා සබැඳි සන්නිවේදන ආකෘතිය නම්කර එහි ඇතුළත් සන්නිවේදන මූලිකාංග තුනක් විස්තර කරන්න.

iv. නිම්මි තුළ දුර්වල ශ්‍රවණ හැකියාවක් ඇතිවීමට හේතු විය හැකි කරුණු හතරක් නම්කර විස්තර කරන්න.

6.i දෘශ්‍ය සන්නිවේදනය යන්නෙන් අදහස් වනුයේ කුමක්දැයි කෙටියෙන් පැහදිලි කරන්න.

ii.සන්නිවේදකයකු සතු විය යුතු වාචික සන්නිවේන කුසලතා දෙකක් නම් කර කෙටියෙන් විස්තර කරන්න.

iii. රූපන කුසලතා වර්ධනයට හේතු වන කරුණු තුනක් නම් කර විස්තර කරන්න.

iv.විධිමත් සන්නිවේදනය හා අවිධිමත් සන්නිවේදනය අතර වෙනස කරුණු හතරක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

7. i සන්නිවේදනය පිළිබඳ විල්බර්ශ්‍රාම්ගේ නිර්වචනය ලියා කෙටියෙන් පැහැදිලි කරන්න.

ii මහජන සන්නිවේදනයේ ප්‍රයෝජන දෙකක් නම්කර විස්තර කරන්න.

iii. ලිඛිත සන්නිවේදන කුසලතා වර්ධනයට හේතුවන කරුණු තුනක් නම් කර විස්තර කරන්න.

iv සමාජ මාධ්‍ය යෙදවුම් කාරක හතතරක් නම්කර උදාහරණ සහිතව විස්තර කරන්න.

SLGURU.LK
For Educational Purpose Only

“The mind is not a vessel to be filled, but a fire to be kindled.” —
Plutarch

Visit SLGURU.LK to download papers and notes.